# <u>තිරසාර කෘෂි වැඩසටහන (FSSP) කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය</u>

## <u>ණය අයදුම්කරුට උපදෙස්</u>

**<u>ඔබ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ හෝ කෘෂි අගයදාමවලට අදාළ වගාවක, ව්‍යවසායක හෝ ව්‍යාපාරයක යෙදෙන්නෙක් නම් 5%ක අඩු පොලී ණය පහසුකම් සඳහා ඔබටත් අයදුම් කළ හැක</u>**

**<u>අයදුම් කිරීමේ ක්‍රමවේදය</u>**

1. අයදුම්පත අදාළ ආකෘති සමග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගන්න. නැතහොත් බාගත කරගන්න.
2. ව්‍යාපාර / ව්‍යවසාය සැලැස්ම සම්පූර්ණ කරන්න
3. ව්‍යපෘතියේ ස්වභාවය අනුව, අදාළ ව්‍යාපෘති සඳහා ක්ෂේත්‍රයේ තාක්ෂණික නිලධාරී හමුවී නිර්දේශ ලබා ගන්න - උදා .: කෘෂිකර්ම උපදේශක, සත්ත්ව සංවර්ධන උපදේශක, අපනයන බෝග ව්‍යාප්ති නිලධාරී මහවැලි ක්ෂේත්‍ර සහකාර වැනි
4. අයදුම්පත්‍රය සම්පූර්ණ කරන්න
5. අයදුම්පත්‍රය, තාක්ෂණික නිලධාරී විසින් නිර්දේශ කරන ලද ව්‍යාපාර / ව්‍යවසාය සැලැස්ම සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දෙන්න. ණය අයදුම්පත් භාර ගන්නා නිලධාරියා විසින් අදාළ අයදුම්පත භාරගත් බවට තහවුරු ලිපියක් නිකුත් කරනු ඇත.
6. ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කරන ලද අයදුම්පත්‍රය ඔබ වෙතට ලබා දෙනු ඇත.
7. ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කල එම අයදුම්පත්‍රය, බැංකුවෙන් ඉල්ලා සිටින ලද සියලු ලියකියවිලි සමඟ ඔබගේ බැංකුවට බාර දෙන්න.

| |
|---|
| *ඔබගේ බැංකුව සමඟ ණය ලබා ගැනීම ගැන සාකච්ඡා කර ඒ සඳහා මූල්‍යමය බාධාවන් පවතින්නේද, බැංකුව ධනාත්මක එකගතාවයක් පෙන්වන්නේද යන්න තහවුරුකර ගැනීම ප්‍රථමයෙන් සිදුකිරීම ප්‍රමාදයන් වලකනු ඇත* |

**තොග ණය සඳහා**

1. ඔබ ගොවීන් සාමූහිකයක් ලෙස / කණ්ඩායම් වශයෙන් එකතුවන්න.
2. ඔබ සාමාජිකත්වය දරන සමූපකාර සමිති, සණස සමිති, ගොවිජන බැංකු හා සමෘද්ධි බැංකු මඟින් (අතරමැදි මූල්‍යකරුවකු ) මඟින් ණය අයදුම් කරන්න.
3. එම සමිතියට අතරමැදි මූල්‍යකරුවකු ලෙස බැංකුවක් මගින් ඔබ වෙත ණය ලබාදීම කල හැකිය.
4. මේ සඳහා ඔබගේ පුද්ගලික අයදුම්පත, සාමූහික අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුලත් අයදුම් පතද සමඟ ඉහත අතරමැදිකරු මගින්, අනුමැතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාරදෙන්න.
5. සාමූහික අයදුම්පත නිර්දේශ කිරීම සඳහා ඉහත **ක්‍රම**වේදයම අනුගමනය කරන්න.